# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.11.01 පැය1700 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1974/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**විදේශීය රටක නිෂ්පාදිත පිස්තෝල අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.**

2025.11.01 වන අද දින උදෑසන කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ පීල්ලවත්ත ප්‍රදේශයේදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර විදේශීය රටක නිෂ්පාදිත පිස්තෝල අවියක්, එම පතරොම් ගැබ් 01 ක් හා ජීව පතරොම් 13 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 39 ක් වන පීල්ලවත්ත, මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු 2025.11.02 වන දින ගරු මිනුවන්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පැය 48 ක රැඳවුම් නියෝග ලබාගැනීමට නියමිතව ඇත.

බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**